# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2440/21 - 2025 ජුනි මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2025.06.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 326 වගන්තිය යටතේ කරනු ලබන නියමය

සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර ඒ. ඒ. සී. ජේ. රාජරත්න වන මා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 326 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත සඳහන් වූ නියමය මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

ඒ. ඒ. සී. ජේ. රාජරත්න,
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර.

2025 ජුනි මස 09 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලය,
නව නගරය, රත්නපුර පිහිටි
පළාත් සභා ගොඩනැගිල්ලේ දී ය.

**නියමය**

1. 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 188(1)(කක) අනු වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව සබරගමුව පළාතේ මහා නගර සභා සම්බන්ධයෙන් එහි නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකවරුන්ට අදාළ වන දීමනා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 289 වගන්තිය යටතේ සාදන නියෝග මගින් නියම කර ඇති ප්‍රමාණයටම විය යුතු වුවත් ඒ සඳහා වලංගු නියෝග මගින් විධිවිධාන සලසා නොමැති හෙයින් ද; සබරගමුව පළාත් සභාව මේ වන විට විසුරුවා හැර ඇති තත්ත්වය යටතේ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන)

1A - PG 7148 — 05 (2025/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 289 වගන්තිය යටතේ වූ අදාළව නියෝග සබරගමුව පළාත් සභාව යටතේ බලාත්මක කරලීමට නීතිමය හැකියාවක් නොමැති හෙයින්ද; සබරගමුව පළාතේ රත්නපුර මහා නගර සභාව සහ කෑගල්ල මහා නගර සභාව සඳහා 262 අධිකාරය වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ විධිවිධානයන්ට අනුකූලව සභිකවරුන් තෝරාපත් කර ගනිමින් ඔවුන්ගේ ධුර කාලය 2025 ජුනි දෙවන දිනෙන් ආරම්භ විය යුතු බවට නියම වී ඇති හෙයින්ද; සබරගමුව පළාතේ රත්නපුර මහා නගර සභාවේ සහ කෑගල්ල මහා නගර සභාවේ පරිපාලනයට අදාළව පැන නැගී ඇති ඉහත කී විශේෂ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගිනිමින් මෙම නියමය සිදු කරනු ලබයි.

2. මෙම නියමය සබරගමුව පළාතේ රත්නපුර මහා නගර සභාවේ සහ කෑගල්ල මහා නගර සභාවේ නගරාධිපති නියෝජ්‍ය නගරාධිපති සහ සභිකවරුන් සඳහා දීමනා ගෙවීමට අදාළ නියමය වශයෙන් හැඳින්වේ.

3. සබරගමුව පළාතේ මහා නගර සභා සම්බන්ධයෙන් නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකවරුන්ට අදාළ දීමනා ගෙවීම සම්බන්ධයෙන් 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 289 වගන්තිය යටතේ ප්‍රකාශිත නියෝගයන් බලාත්මක වන තෙක් වලංගු වන පරිදි රත්නපුර මහා නගර සභාවේ සහ කෑගල්ල මහා නගර සභාවේ නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකවරුන් සඳහා ගෙවිය යුතු දීමනා මෙහි මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට විය යුතුය.

4. මහා නගර සභාවේ නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති සහ සභිකවරුන්ට ගෙවිය යුතු මාසික දීමනා ප්‍රමාණ කලින් කල ඒ හා සම්බන්ධව රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අනුකූල විය යුතු අතර එසේ නියම කරනු ලබන උපරිමයන්ට යටත්ව ගත වූ මාසය වෙනුවෙන් අනුගාමී මාසය තුළ ගෙවිය යුතුය.

5. පහත සඳහන් අවස්ථානුගත කාරණා යටතේ යම් නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති සභිකවරයෙකු දීමනා සඳහා හිමිකම් නොතිබිය යුතුය.

(1) මහා නගර සභා රැස්වීම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ මහා නගර සභාවේ කටයුතු අත්හිටුවන ලැබූ සභිකයකු සම්බන්ධයෙන් එසේ අත්හිටුවනු ලැබූ කාලසීමාව සඳහා

(2) අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභා පනත යටතේ හෝ වෙනත් කිසියම් සාපරාධී චෝදනාවකට අත්අඩංගුවට පත්ව රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටින කාලසීමාව සඳහා

(3) මහා නගර සභාවේ අවසර ඇතිව වෛද්‍ය හේතුන් මත හෝ වෙනත් මහා නගර සභාවේ රාජකාරී කටයුත්තක් වෙනුවෙන් නිවාඩු ලබා ඇති විටෙකදී හැර මහා නගර සභාවේ අවසරය ඇතිව හෝ සභාවේ අවසරයකින් තොරව සභාවේ සාමාන්‍ය රැස්වීම්වලට සහභාගි නොවීම.

(4) කිසියම් ලිඛිත නීතියක් යටතේ මහා නගර සභාවේ නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකවරයකුගේ ධුරය අත්හිටුවා ඇති විටෙකදී.

6. මහා නගර සභාවක රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකවරුන්ට මාසිකව ගෙවිය යුතු යැපීම් දීමනා, ගමන් වියදම් දීමනාවල එකතුව උපරිමය අදාළ මහා නගර සභාවේ වාර්ෂික අයවැය ලේඛනයේ ආදායම් සැලකිල්ලට ගනිමින් රුපියල් 8000.00 (අට දහසක) උපරිමකට යටත්ව සභාව විසින් තීරණය කරනු ලබන මුදලක් විය යුතුය.

7. නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකවරයා විසින් ඉහත (6) උපවගන්තිය යටතේ වන දීමනා ඉල්ලුම් කිරීමේදී මෙම නියෝග යටතේ පරිශිෂ්ඨයේ ඇතුළත් ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයට සමග අදාළ මාසය වෙනුවෙන් අනුගාමී මාසය තුළ විධිමත් ගමන් වියදම් වවුචරයක් ඉදිරිපත් කළ යුතුය.

8. මෙම නියමයෙහි සිංහල දෙමළ ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හට ගතහොත් සිංහල පාඨය ප්‍රමුඛ වේ.

*පරිශිෂ්ඨය*

**යැපීම් දීමනාව හා ගමන් වියදම් දීමනා ඉල්ලීම සම්බන්ධයෙන් වන ප්‍රකාශයයි**

.................................... මහා නගර සභාව

යැපීම් දීමනාව : ....................................................................................

ධුරධාරියාගේ නම : ..............................................................................

ධුරය : නගරාධිපති/නියෝජ්‍ය නගරාධිපති/සභික

නගරාධිපතිවරයා සඳහා රු. 1000/= නියෝජ්‍ය නගරාධිපතිවරයා සඳහා රු. 800/= සභිකවරයෙක් සඳහා රු. 700/= ක් වේ. මෙම අගයන් පැය 12 ක් හෝ ඊට වඩා වැඩි පැය 24ක සේවා කාලයක් සඳහා අදාළ වේ. පැය 6කට වඩා වැඩි පැය 12කට වඩා අඩු කාලයක් සඳහා මෙම දීමනාවෙන් අඩක් හිමි වේ.

........................................................ මහා නගර සභාවේ කටයුතු සඳහා පසුපිටේ විස්තර කර ඇති ස්ථානයන්ට යාම වෙනුවෙනි.

1. පෞද්ගලික වාහනය භාවිතා කර ඇති විටකදී (මෝටර් රථයක් සඳහා කිලෝමීටරයකට උපරිම රු. 20/- යතුරුපැදියක් හෝ ත්‍රීරෝද රථයක් සඳහා කිලෝමීටරයකට උපරිම රු. 10/-) ඒ සඳහා දරන ලද මුදල ............................
2. යැපීම් දීමනාව
3. ඉල්ලන මුදල

| රු. | ශත |
|---|---|
| | |
| | |
| | |

රුපියල් ............................................................................................................ ශත .................................................... සමන්විත ඉහත සඳහන් ඉල්ලීමට ඇතුළත් වනුයේ ......................................................... මහා නගර සභාවේ කටයුතු පිණිස මා ගිය ගමන් පිළිබඳ නිවැරදි සටහනක් බවත් එහි සඳහන් ගමන් වියදම් දීමනාව සහ යැපීම් දීමනා සත්‍ය වශයෙන්ම සභාවේ කාර්යයන් සඳහා දරන ලද බවත් සහතික කරමි.

........................................
ඉල්ලුම්කරුගේ අත්සන
දිනය .............................

EOG 06 - 0111

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.